# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.06 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/393/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු
## Important information reported to the Police Media Division

**01. කුෂ් මත්ද්‍රව්‍ය හා හෂිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2026.03.06 දින අළුයම කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 06 ග්‍රෑම් 590 ක් හා හෂීස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 04 ග්‍රෑම් 910 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු අවුරුදු 35 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**Suspect arrested with Kush and Hashish drugs - Police Narcotics Bureau Airport Unit.**

On the morning of 06.03.2026, a team of officers from the Police Narcotics Bureau Airport Unit conducted a raid at the arrival terminal of the Bandaranaike International Airport in Katunayake and arrested a suspect with 06 kilograms 590g of Kush drugs and 04 kg 910g of Hashish drugs.

The suspect is a 35-year-old resident of Colombo 14.

The Police Narcotics Bureau Airport Unit is conducting further investigations.

**02. දිය අනතුරකින් විදේශ ජාතිකයෙකු බේරා ගැනීම - හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.**

2026.03.05 වන දින සවස් කාලයේ හික්කඩුව වරාය අසල මුහුදු තීරයේ දියනෑමට ගිය විදේශ ජාතිකයෙකු දිය වැලකට හසුවී මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත පොලිස් කොස්තාපල් 9372 ලාල් හා පොලිස් කොස්තාපල් 79128 ජයනන්ද යන නිලධාරීන් විසින් එම පුද්ගලයා බේරාගෙන ඇත.

**අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 52 ක් වන රුසියානු ජාතිකයෙකි.**

**Rescue of a foreign national from a water accident - Hikkaduwa Police Lifeguard Unit.**

On the evening of 05.03.2026, a foreign national who had gone for a swim at the seashore near the Hikkaduwa harbor was caught in a rip current and was being swept out to sea. Police Constable 9372 Lal and Police Constable 79128 Jayananda, officers attached to the Hikkaduwa Police Lifeguard Unit who were on duty at the beach, rescued the person.

The person who was in the accident is a 52-year-old Russian national.

**03. නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි තොගයක් සමඟ විදේශ ජාතිකයෙකු අත්අඩංගුවට - කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2026.03.05 දින දහවල් කොල්ලුපිටිය පොලිස් වසමේදී කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි 1500 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කොල්ලුපිටිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 39 ක් වන චීන ජාතික පුද්ගලයෙකි.**

කොල්ලුපිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

A foreign national was arrested with a consignment of cigarettes illegally brought into the country - Colombo South Divisional Criminal Investigation Bureau.

On the afternoon of 2026.03.05, a team of officers from the Colombo South Divisional Criminal Investigation Bureau conducted a raid in the Kollupitiya Police Division and arrested a suspect with 1500 cigarettes illegally brought into the country and presented them to the Kollupitiya Police.

The suspect is a 39-year-old Chinese national.

The Kollupitiya Police are conducting further investigations.

**04. නීති විරෝධි මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව දිස්ත්‍රික් වැටලීම් අංශය.**

2026.03.05 දින සවස ජාඇල පොලිස් වසමේ වහටියගම ප්‍රදේශයේදී මීගමුව දිස්ත්‍රික් වැටලීම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 67 (බෝතල් 90) ක් හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 945 ක් (බැරල් 05) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පමුණුගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 45 ක් වන ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**Suspect arrested with illegal liquor and Goda - Negombo District Raid Division.**

On the evening of 2026.03.05, a team of officers from the Negombo District Raid Division conducted a raid in the Wahatiyagama area of Ja-Ela Police Division and arrested a suspect with 67 liters (90 bottles) of illegal liquor and 945 liters (05 barrels) of Goda used to brew illegal liquor and presented him to the Pamunugama Police Station.

The suspect is a 45-year-old resident of Gampaha.

The Pamunugama Police are conducting further investigations.